		Electrical Equipment	****6112203	36,097,240.46	1,585,155.50	0.00	544,743.20	867,980.00	37,359,159.16
		Communication Equipment	****6112204	11,162,230.46	1,333,276.47	0.00	851,795.98	173,082.50	13,174,220.41
		Furniture	****6112205	112,714,938.14	14,355,522.30	0.00	2,303,278.70	2,033,938.12	127,339,801.02
		Sports equipment	****6112208	1,650.00	98,500.00	0.00	0.00	0.00	100,150.00
		Defence Equipment	****6112215	20,000.00	0.00	0.00	0.00	0.00	20,000.00
		Agricultural & Dairy Farm Equipment	****6112216	319,146.00	78,705.00	0.00	0.00	17,250.00	380,601.00
		Fire Protection Equipment	****6112217	927,611.00	0.00	0.00	0.00	0.00	927,611.00
9153-->	4.1-Land		61410	196,931,750.00	36,960,000.00	0.00	0.00	0.00	233,891,750.00
		Land	****614100	196,931,750.00	36,960,000.00	0.00	0.00	0.00	233,891,750.00
9153-->	4.1-Urban or Built-		61411	334,142,400.00	0.00	0.00	0.00	0.00	334,142,400.00

and Services							

REMARKS

This is a computer-generated document. No signature is required.

-

Report Generated by the new CIGAS Web Application--Developed by S.Tharshan - Director, Dept of State Accounts

අග්‍රිම සැසඳුම් ප්‍රකාශය

වෙනත් ආයතන විසින්, වාර්තාකරණ ආයතනය වෙනුවෙන් එකතු කරන ලද ආදායම	-	
අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් දරන ලද වියදම්	4,195,080,676	
අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් අත්තිකාරම් "බී" ගිණුම වෙනුවෙන් කරන ලද හර කිරීම්	47,425,944	
අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් "බී" ගිණුමට කරන ලද බැර කිරීම්	11,400,181	4,253,906,801
අඩු කළා :		
අනෙකුත් ආදායම් ශීර්ෂ වෙනුවෙන්, වාර්තාකරණ ආයතනය විසින් එකතු කරන ලද ආදායම්	194,974,763	
වෙනත් ආයතන විසින්, වාර්තාකරණ ආයතනය වෙනුවෙන් දරන ලද වියදම්	334,120	
අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් අත්තිකාරම් "බී" ගිණුම වෙනුවෙන් කරන ලද බැර කිරීම්	42,098,189	
අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් "බී" ගිණුමට කරන ලද හර කිරීම්	1,309,094	238,716,166
2021 දෙසැම්බර් 31 දිනට අග්‍රිම සැසඳුම් ප්‍රකාශය		**4,015,190,635**

* ඉහත සඳහන් අයිතමවලට අමතරව අදාළ වන අයිතමයන් ගැලපීම් කළ හැක.

3.5. ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

රු. ,000

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
1002.07.00	මුද්දර ගාස්තු	-	-	312	-
1003.07.02	රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවට අදාල ලියාපදිංචි කිරීමේ ගාස්තු	-	23,566	25,363	108%
1003.07.03	පෞද්ගලික දැව ප්‍රවාහනය	-	-	1,067	-
1003.07.04	මෝටර් රථ විකිණීම මත බදු	-	-	5	-
1003.07.05	රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයට අදාළ බලපත්‍ර ගාස්තු	-	400	401	100%
1003.07.09	කාබන් බද්ද	-	-	-	-
1003.07.99	බලපත්‍ර - අනෙකුත්	-	6,500	5,963	91.73%
2002.01.01	රජයේ ගොඩනැගිලි කුලී	-	1,510	1,440	95%
2002.01.99	අනෙකුත් කුලී	-	100	47	47%
2002.02.99	පොලිය -වෙනත්	-	11,000	13,400	122%
2003.02.13	විභාග හා අනෙකුත් ගාස්තු	-	-	195	-
2003.02.14	මෝටර් රථ ප්‍රවාහන පණත යටතේ අය කරනු ලබන ගාස්තු හා අනෙකුත් ලැබීම්	-	-	53,810	-
2003.02.03	1968 අංක 32 දරන පුද්ගලයන් ලි.ප. කිරීමේ පනත යටතේ ගාස්තු	-	-	6,397	-
2003.02.99	විකුණුම් හා ගාස්තු -විවිධ ලැබීම්	-	996	631	63%
2003.04.00	රජයේ නිලධාරීන්ට ලබා දෙන යතුරු පැදි සම්බන්ධ මූලික ගෙවීම	-	-	-	-
2003.99.00	විකුණුම් හා ගාස්තු - අනෙකුත් ලැබීම්	-	11,324	7,397	65%

2003.07.00	රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන	-	-	-	-
2004.01.00	සමාජ සංරක්ෂණ දායක මුදල් -මධ්‍යම රජය	-	-	78,548	-
2006.02.00	ප්‍රාග්ධන වත්කම් විකිණීම	-	-	-	-

3.6.වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	1,199,500	1,527,600	1,511,564	98.95%
ප්‍රාග්ධන	167,500	167,500	51,678	30.85%

3.7.මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	අවසාන ප්‍රතිපාදන රු.	තත්‍ය වියදම රු.	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
1	ජනාධිපති ලේකම් කාර්යාලය	ජනපති සදහම්යාත්‍රා ධර්ම දේශන	388	388	100
2	බුද්ධශාසන, සංස්කෘතික, ආගමික කටයුතු අමාත්‍යාංශය	ගොඩනැගිලි අලුත්වැඩියාව ප්‍රගති සමාලෝචන රැස්වීම් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ආගමික සහජීවන වැඩසටහන උණ සංවර්ධිත දහම් පාසල් /විහාරස්ථාන වැඩිදියුණු කිරීම තිරසර පුණ්‍යග්‍රාම වැඩසටහන	32,855	26,509	81
3	අධිකරණ අමාත්‍යාංශය	ලිපිද්‍රව්‍ය සමථ මණ්ඩල පනත ක්‍රියාත්මක කිරීම කාර්යාලීය උපකරණ සම්මුඛ පරීක්ෂණ පුනරාවර්තන වියදම් සහජීවනය ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන දීපවාලි උත්සවය සැමරීම නත්තල් උත්සවය	17,175	13,223	77
4	සෞඛ්‍ය අමාත්‍යාංශය	අවු. 70 ඉක්ම වූ අඩු ආදායම්ලාභීන්ගේ දීමනාව අවු. 100 ඉක්මවූවන්ට දීමනාව	501,795	495,480	99
5	වෙළෙඳ අමාත්‍යාංශය	සිංහරාජ විශේෂ ඒකාබද්ධ සංවර්ධන වැඩසටහන 2019 අතැති බිල් ගෙවීම වැටුප් දීමනා	15,725	15,510	99
6	මහාමාර්ග අමාත්‍යාංශය	පරිපාලන වියදම් ගෙවීම	15,725	15,510	

7	කෘෂිකර්ම අමාත්‍යාංශය	පුනරාවර්තන වියදම්	30,675	30,162	98
		යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ			
		කෘෂිකර්ම තරුණ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන			
		දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු රැස්වීම			
8	ඉඩම් අමාත්‍යාංශය	පුනරාවර්තන වියදම්	503,655	385,870	77
		ඉඩම් අත්පත් කරගැනීම වෙනුවෙන් වන්දි			
9	රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය	උපාධිධාරී පුහුණු දීමනාව (2019 /2020/2021 බඳවාගත්)	674,039	650,580	96
		කළමනාකරණ නොවන නිලධාරීන් සඳහා පුහුණු කිරීමේ වැඩසටහන්			
10	පරිසර අමාත්‍යාංශය	පුනරාවර්තන වියදම්	15,314	10,325	67
		සුරකිමු ගංගා ජාතික පාරිසරික වැඩසටහන			
		හරිත ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය මගින් පරිසර සංරක්ෂණ වැඩසටහන			
11	තාක්ෂණ අමාත්‍යාංශය	e-NIC වැඩසටහන	1,523	1,137	75
12	තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය	ග්‍රාමීය ක්‍රීඩාපිටි 335 සංවර්ධනය	30,693	18,192	59
		වොලිබෝල් ක්‍රීඩාපිටි සංවර්ධනය			
		පුහුණු වැඩසටහන්			
		යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ			
13	වාරිමාර්ග අමාත්‍යාංශය	2019- නිල්වලා එළිය නගර සංවර්ධන වැඩසටහන	34,263	1,780	5
14	බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව	පියදාස රත්නායක අනුස්මරණ සිල්මාතා අභ්‍යාස ආයතනයේ වියදම්	47,314	39,814	84
		පුනරාවර්තන වියදම්			
		දහම් සරසවිය			
15	මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව	මුස්ලිම් සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම හා පල්ලි වැඩිදියුණු කිරීම	687	677	98
16	ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව	වැලිගම සුව සහනයේ ජේසු සම්දුන්ගේ සිද්ධස්ථානයේ යටිතල පහසුකම් සංවර්ධනය	582	582	100

17	සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව	පුනරාවර්තන වියදම්	4,837	4,433	92
		ප්‍රගති සමාලෝචන රැස්වීම			
18	රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව	පුනරාවර්තන වියදම්	208	180	86
		ප්‍රාග්ධන වියදම්			
19	සමාජ සේවා දෙපාර්තමේන්තුව	නිවාඩු දින වැටුප්	16,192	16,091	99
		ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩසටහන			
20	පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව	පුනරාවර්තන වියදම්	2,346	2,293	99
		ඒකාබද්ධ ළමා හා කාන්තා ආදර්ශ ගම්මාන වැඩසටහන			
		කැපකරු,දෙගුරු, ආධාර වැඩසටහන			
21	ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව	පුනරාවර්තන වියදම්	11,443	5,152	45
		වොලිබෝල් ක්‍රීඩා පිටි සංවර්ධනය			
		ජාතික ශාරීරික සුවතා ව්‍යාපෘතිය			
		රසායනික ද්‍රව්‍ය මිලදී ගැනීම			
		කාර්යාල උපකරණ මිලදී ගැනීම			
22	පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව	පුනරාවර්තන වියදම්	18,733	18,733	100
23	ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව	විමධ්‍යගත අයවැය වැඩසටහන	529,321	454,310	86
		සපිරිගමක් (අවිච්ඡේද - 2020)			
24	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව	ගොඩනැගිලි අලුත්වැඩියා	1,375	0	0
25	ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව	පුනරාවර්තන වියදම්	1,779	1,603	90
		වී අස්වැන්න ඇස්තමේන්තු කිරීමේ සමීක්ෂණය			
		උපකරණ අලුත්වැඩියාව			
26	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	පුනරාවර්තන වියදම්	7,419		
27	රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව	රෙජිස්ට්‍රාර් දීමනාව	1,769	1,706	96
		ගොඩනැගිලි අලුත්වැඩියා			
28	ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව	පුනරාවර්තන වියදම්	501	330	66

29	අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව	ගොඩනැගිලි ඉදිකිරීම් හා අලුත්වැඩියා කිරීම	1,600	1,593	99
30	ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය	ගොඩනැගිලි ඉදිකිරීම්	3,863	2,140	55
		ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම.			
31	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව	පුනරාවර්තන වියදම්	2,096	1,642	78
		යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ			
32	ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව	පුනරාවර්තන වියදම්	24	23	96
33	ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව	පුනරාවර්තන වියදම්	2,792	2,600	93
		සංවර්ධන ව්‍යාපෘති			
		ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ			
34	මිනිස්බල සහ රැකිරක්ෂා දෙපාර්තමේන්තුව	පුනරාවර්තන වියදම්	1,920	1,399	73
		මාර්ගෝපදේශන වැඩසටහන්			
		උපකරණ මිලදී ගැනීම			
35	බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව	පුනරාවර්තන වියදම්	679,107	656,931	97
36	ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්ප ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය	කලා, කව හඳුනාගැනීම	144	99	69
37	ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	ක්‍රීඩාංගන සංවර්ධනය	10,616	4,484	42
		ක්‍රීඩා පහසුකම් ප්‍රවර්ධනය			
38	කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය	පුනරාවර්තන වියදම්	264,146	252,071	95
		ගැබිනි මව්වරුන්ගේ පෝෂණ දීමනා			
		පෙර පාසල් දරුවන් සඳහා උදෑසන ආහාර වේල ලබා දීම			
		ආදායම් උත්පාදන මාර්ග සඳහා පෙළඹවීමේ පුහුණු වැඩසටහන			
		ළමා දිරිය පෙර පාසල් දීමනාව			
		ප්‍රගති සමාලෝචන රැස්වීම්			

39	වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	පුනරාවර්තන වියදම්	74,625	44,262	59
		එක් ගමකට එක් ව්‍යවසායකයෙක් බිහි කිරීමේ වැඩසටහන			
		ග්‍රාමීය කර්මාන්ත සඳහා දේශීය හා විදේශීය වෙළඳපොළ ප්‍රවර්ධන වැඩසටහන			
		ග්‍රාමීය හා සාම්ප්‍රදායික කර්මාන්ත ගම්මාන ඒකාබද්ධ සංවර්ධන වැඩසටහන			
40	රාජ්‍ය ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය	පුනරාවර්තන වියදම්	666,607	623,129	93
		සංචාරක බංගලා ඉදිකිරීම් හා අලුත්වැඩියා			
		කාර්යාල උපකරණ මිලදී ගැනීම			
		ආපදාවන්ගෙන් හානියට පත් නිවාස සඳහා වන්දි			
		නැවත පදිංචි කිරීමේ වැඩසටහන			
		හදිසි ආපදා සඳහා ප්‍රතිචාර දැක්වීම			
		ගංවතුර පාලනය කිරීම සඳහා ගංගාවල බාධා ඉවත් කිරීමේ වැඩසටහන			
		ග්‍රාම නිලධාරී ව්‍යාපෘතිය			
41	විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළෙඳපොළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය	පුනරාවර්තන වියදම්	31,249	30,723	98
		ප්‍රගති සමාලෝචන රැස්වීම			
		වැඩසටහන්			
42	සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌණ උපයෝජන රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	පුනරාවර්තන වියදම්	461,350	321,310	70
		වකුගඩු රෝගීන් සඳහා ජීවනාධාර			
		ආබාධිත පුද්ගලයින් සඳහා දීමනා			
		තනි මා පිය පවුල් සංවර්ධන වැඩසටහන			
		සමෘද්ධි පවුල් 200000 සවිබල ගැන්වීම			
		සෞභාග්‍ය ජාතික වැඩසටහන			
		ජාතික ගෙවතු වගා වැඩසටහන			
43	දේශීය වෛද්‍යකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධනය සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශය	පුනරාවර්තන වියදම්	8,703	8,475	97

44	නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය	පුනරාවර්තන වියදම්	873	547	63
		නිපුණතා සංවර්ධන රැස්වීම			
45	දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය	ගොඩනැගිලි ඉදිකිරීම්	8,060	2,349	29
46	වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පළතුරු, මිරිස්, ඌණු හා අර්තාපල් වගා ප්‍රවර්ධනය, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය	පුනරාවර්තන වියදම්	3,738	3,639	97
		කැකුළු තුරු උදාන ජාතික රුක්රෝපණ වැඩසටහන			
47	පොහොර නිෂ්පාදන හා සැපයුම්, රසායනික පොහොර හා කෘමිනාශක භාවිත නියාමන රාජ්‍ය අමාත්‍යාංශය	පුනරාවර්තන වියදම්	368	299	81
		පසු අස්වනු සමීක්ෂණ වැඩසටහන			
48	පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා අශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය	වැලිගම පොල්කොළ මැලවීමේ හා කුණු වීමේ රෝග මර්ධන වැඩසටහන	32,200	26,748	83
		කිතුල් සංවර්ධන ව්‍යාපෘතිය			
49	උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග සංවර්ධනය ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	අපනයන කෘෂි කලාප පිහිටුවීමේ වැඩසටහන	6,357	1,151	18
		ගොඩනැගිලි අලුත්වැඩියාව			
50	ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	SACOSAN	6,250	6,250	100
		සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීමේ වැඩසටහන			
51	ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය	ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන	128,300	0	0

3.8.මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2021 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2021 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	1,160,801	1,160,801	-	-
9152	යන්ත්‍රෝපකරණ	559,299	559,299	-	-
9153	ඉඩම්	568,034	568,034	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	240,829	240,829	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.9.විගණකාධිපතිවරයාගේ වාර්තාව

පසුපිට අමුණා ඇත.

04 පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක

4.1.ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100%-90%	75%-89%	50%-74%
මූලධන ප්‍රතිපාදන උපයෝගීතා කාර්යසාධන දර්ශකය			31%
පුනරාවර්තන ප්‍රතිපාදන උපයෝගීතා කාර්යසාධන දර්ශකය	99%		

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1.හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

අරමුණ	ඉලක්කය	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
සියල්ලන් සඳහාම පෝෂිත පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය පූර්ණ ඵලදායී සහ යහපත් රැකියා	ජාතික තත්වයන්ට අනුකූලව දිස්ත්‍රික්කය තුළ ඒක පුද්ගල ආර්ථික වර්ධනය පවත්වාගෙනයාම	සමෘද්ධි ගෘහ ආර්ථික ක්ෂුද්‍ර මූල්‍ය ස්වයං රැකියා ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ ජීවනෝපාය ව්‍යාපෘති- 29 ක් ක්‍රියාත්මක කිරීම.			√
		පොල් කිතුල් හා තල් වගා ප්‍රවර්ධන හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිශ්පාදන රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත කිතුල් සංවර්ධන ව්‍යාපෘති 05 ක් ක්‍රියාත්මක කිරීම.			√
		වේවැල් පිත්තල මැටි ලීබඩු හා ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත සම්ප්‍රදායික ගම්මාන 04 ක් සංවර්ධනය කිරීම.			√
සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරිගැන්වීම	ආර්ථික සංවර්ධනය සහ මානව යහපැවැත්ම වෙනුවෙන් සියලුදෙනාටම ලබාගතහැකි ප්‍රවේශ වියහැකි ගුණාත්මක වශයෙන් ඉහළ විශ්වාසදායී තිරසර සහ අපදාවන්ට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම	සමෘද්ධි ගෘහ ආර්ථික ක්ෂුද්‍ර මූල්‍ය ස්වයං රැකියා ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ යටිතල පහසුකම් ව්‍යාපෘති 52ක් ක්‍රියාත්මක කිරීම			√
		ග්‍රාමීය මාර්ග හා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත ග්‍රාමීය මාවත් 150ක් සංවර්ධනය කිරීම	√		
		මුදල් අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ ග්‍රාමීය මාවත් 85 ක් සංවර්ධනය කිරීම			√
		මුදල් අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත විමධ්‍යගත			√

		අයවැය වැඩසටහන යටතේ ග්‍රාමීය ඇල මාර්ග 24 ක් සංවර්ධනය කිරීම			
නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුභසාධනය ප්‍රවර්ධනය කිරීම	2030 වනවිට බෝ නොවන රෝග නිසා සිදුවන අකල් මරණ, ප්‍රතිකාර මගින් හා වලක්වා ගැනීමේ ක්‍රම මගින් තුනෙන් එකකින් අඩු කර ගැනීම සහ මානසික සෞඛ්‍ය සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම.	ග්‍රාමීය හා ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත ග්‍රාමීය ක්‍රීඩාපිටි ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන යටතේ ක්‍රීඩාපිටි 15ක් ප්‍රතිසංස්කරණය			√
		මුදල් අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ ග්‍රාමීය ක්‍රීඩාපිටි 04ක් ප්‍රතිසංස්කරණය කිරීම			√
	විශේෂයෙන්ම අවම වශයෙන් දියුණු වූ රටවල සහ කුඩා දිවයින් රාජ්‍යන්හි සෞඛ්‍ය සේවාවන් වෙනුවෙන් වෙන් කරන මුදල් සහ සෞඛ්‍ය කාර්යය මණ්ඩල බදවා ගැනීම සංවර්ධනය කිරීම, පුහුණු කිරීම සහ පවත්වාගෙන යාම සැලකිය යුතු මට්ටමකින් වැඩිකිරීම.	මුදල් අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ සෞඛ්‍ය මධ්‍යස්ථාන 12 ක් සංවර්ධනය කිරීම.			√
සෑමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබාගැනීම සහ ඒවායේ තිරසර කළමනාකරණය සහතික කිරීම.	2030 වන විට සියලුදෙනාට සමානාත්මතාවෙන් යුතුව ආරක්ෂාකාරී සහ අඩු මිලකට පානීය ජලය ලබා ගැනීමට හැකිවීම.	මුදල් අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ ජල ව්‍යාපෘති 12 ක් ස්ථාපිත කිරීම			√
සියල්ල සඳහා දැරිය හැකි, විශ්වාසනීය, තිරසර සහ නවීන බලශක්ති සැපයුම් සහතික කිරීම.	2030 වන විට සියලුදෙනාටම අඩු මිලකට ලබාගත හැකි විශ්වාසදායී නවීන බල ශක්ති මූලාශ්‍රවලට ප්‍රවේශ විය හැකි බව තහවුරු කිරීම.	මුදල් අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ නව විදුලි සැපයුම් ලබාදීමේ ව්‍යාපෘති 15 ක් ස්ථාපිත කිරීම			√
පරිපූර්ණ , සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සෑමට ජීවිත කාලය පුරා	2030 වන විට එලදායී ඉගෙනුම් ප්‍රතිඵල ලබාගැනීමට හැකිවන ආකාරයෙන් සියලුම ගැහැණු ළමුන් සහ පිරිමි ළමුන් නිදහස් සමාන සහ ගුණාත්මකභාවයෙන්	මුදල් අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ පාසල් සඳහා උපකරණ ලබාදීමේ ව්‍යාපෘති 48 ක් ක්‍රියාත්මක කිරීම			√

ඉගෙනීමේ අවස්ථාව සැලසීම.	ඉහළ ප්‍රාථමික අධ්‍යාපනයක් සම්පූර්ණ කර සිටින බව තහවුරු කිරීම.				
	2030 වනවිට ඉගෙනුම ලබන සියලුම දෙනා තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහාවූ දැනුම හා කුසලතාවන් ලබාගෙන සිටීම. එයට තිරසර සංවර්ධනය පිලිබඳ අධ්‍යාපනය සහ තිරසර ජීවන රටාවක් මානව අයිතිවාසිකම් සාමය සහ ප්‍රචන්ඩත්වයයෙන් තොර සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම,ගෝලීය පුරවැසිභාවය සහ සංස්කෘතික විවිධත්වය ඇගයීම සහ තිරසර සංවර්ධනයට සංස්කෘතිකමය වශයෙන් දායකවීම ඇතුළත්වේ.	බුද්ධ සාසන ආගමික සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත පන්සල් ,දහම් පාසල් සංවර්ධන වැඩසටහන් හා අධ්‍යාත්මික වැඩසටහන් 87 ක් ක්‍රියාත්මක කිරීම			√
		දහම්පාසල් පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත පිරිවෙන් 08ක් සංවර්ධනය කිරීම			√

5.2.තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

ජයග්‍රහණ

- මාතර දිස්ත්‍රික්කයේ ජනතාවගේ ජීවනෝපාය මාර්ග සංවර්ධනය කිරීමට හැකි වීම.
- මාතර දිස්ත්‍රික්කයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට හැකිවීම.

අභියෝග

- කොවිඩ් 19 රෝගය නිසා ඇති වූ බලපෑම.
- ප්‍රතිපාදන ලැබීම සීමා වීම.
- අයහපත් කාලගුණ තත්වය

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1.සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/(අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	56	52	4
තෘතීයික	38	33	5
ද්විතියික	1483	1544	(61)
ප්‍රාථමික	156	157	(1)

6.2.ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේද

බලපෑමක් සිදු වී නැත.

6.3.මානව සම්පත් සංවර්ධනය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	56	52	4
තෘතීයික	38	33	5
ද්විතියික	1483	1544	(61)
ප්‍රාථමික	156	157	(1)

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාල කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ			
1.1.	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2.	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3.	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම(වාණිජ අත්තිකාරම් ගිණුම)	අදාල නොවේ		
1.4.	ගබඩා අත්තිකාරම් ගිණුම	අදාල නොවේ		
1.5.	විශේෂ අත්තිකාරම් ගිණුම	අදාල නොවේ		
1.6.	වෙනත්	අදාල නොවේ		

2	පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම(මූ.රෙ.445)			
2.1.	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2.	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3.	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4.	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5.	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
2.6.	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7.	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8.	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9.	හානිපාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10.	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11.	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මූ.රෙ.135)			
3.1.	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2.	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3.	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම.	අනුකූල වේ		
3.4.	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව,රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම.	අනුකූල වේ		
4	වාර්ෂික සැලසුම් සකස් කිරීම			
4.1.	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2.	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3.	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4.	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5.	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

5	විගණන විමසුම්			
5.1.	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට,සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල නොවේ	කොවිඩ් වසංගත තත්වය මත කාර්යාලය වසා තිබීම හා කාර්ය මණ්ඩලය කැඳවීම සිමා කර තිබීම	
6	අභ්‍යන්තර විගණනය			
6.1.	මු.රෙ.134(2) DMA/1-2019 අනුව,වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව,අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2.	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3.	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව,සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4.	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව,සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
7	විගණන හා කළමනාකරණ කමිටු			
7.1.	DMA චක්‍රලේඛ 1-2019 අනුව,අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම.	අනුකූල නොවේ	කොවිඩ් 19 වසංගත තත්ත්වය මත පැවැත්විය නොහැකි වීම.	
8	වත්කම් කළමනාකරණය			
8.1.	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිළදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.2.	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව , එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම.	අනුකූල වේ		
8.3.	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව,භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.4.	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම.	අනුකූල වේ		
8.5.	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම.	අනුකූල වේ		
9	වාහන කළමනාකරණය			

9.1.	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
9.2.	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම.	අනුකූල නොවේ	අපහරණ ක්‍රියාවලිය සඳහා දීර්ඝ කාලයක් ගත වීම.	අදාළ කමිටු නිර්දේශය හා අනුමැතිය ඉක්මනින් ලබා ගැනීම.
9.3.	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
9.4.	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ		
9.5.	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව,වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.	අනුකූල නොවේ	ඉන්ධන සපයා ගැනීම් සීමා වීම මත ප්‍රමාද වී ඇත.	
9.6.	කල්බදු කාල සීමාවෙන් අනතුරුව,බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ		
10	බැංකු ගිණුම් කළමනාකරණය			
10.1.	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
10.2.	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
10.3.	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
11	ප්‍රතිපාදන උපයෝජනය			
11.1.	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම.	අනුකූල වේ		
11.2.	මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදී බැරකම්වලට එලඹීම.	අනුකූල වේ		
12	රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම			
12.1.	සීමාවන් වලට අනුකූල වීම.	අනුකූල වේ		
12.2.	හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම.	අනුකූල වේ		
12.3.	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල නොවේ	සේවය හැර ගිය සහ සේවයෙන් පහ කළ නිලධාරීන් දෙදෙනෙකුගේ වසර 05ට වැඩි ණය ශේෂ නිරවුල් නොවී ඇත.	මු.රෙ.109 යටතේ අලාභය පොතෙන් කපා හැරීම සඳහා අනුමැතියට ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට යවා ඇත.
13	පොදු තැන්පත් ගිණුම			
13.1.	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන්	අනුකූල	ප්‍රමාණවත් පරිදි අක්	භාණ්ඩාගාරය

	මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	නොවේ	මුදල් නොලැබීම	දැනුවත් කර ඇත.
13.2.	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
14	අග්‍රිම ගිණුම			
14.1.	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ		
14.2.	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම,එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
14.3.	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදී තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල වේ		
14.4.	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ		
15	ආදායම් ගිණුම			
15.1.	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම.	අනුකූල වේ		
15.2.	රැස් කර තිබූ ආදායම්,තැන්පත් ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම.	අනුකූල වේ		
15.3.	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
16	මානව සම්පත් කළමනාකරණය			
16.1.	අනුමත කාර්ය මණ්ඩල සිමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම.	අනුකූල නොවේ	රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් මත උපාධිධාරී අභ්‍යාසලාභීන් ලෙස බඳවා ගත් නිලධාරීන්ට පත්වීම් ලබා දීම.	අතිරික්ත සේවක සංඛ්‍යාව සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරීම.
16.2.	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම.	අනුකූල වේ		
16.3.	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
17	මහජනයා වෙත තොරතුරු ලබා දීම			
17.1.	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
17.2.	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර,වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල වේ		

17.3.	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
18	පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම			
18.1.	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල නොවේ	කොවිඩ් 19 බලපෑම.	මෙම වසරේ සිට ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් පවතී.
18.2.	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි,පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල නොවේ		මෙම වසරේ සිට ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් පවතී.
19	මානව සම්පත් සැලැස්ම සම්පාදන කිරීම			
19.1.	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල නොවේ	කොවිඩ් 19 බලපෑම.	මෙම වසරේ සිට ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් පවතී.
19.2.	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල නොවේ	කොවිඩ් 19 බලපෑම.	මෙම වසරේ සිට ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් පවතී.
19.3.	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්යමණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල නොවේ		මෙම වසරේ සිට ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් පවතී.
19.4.	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම,නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම.	අනුකූල වේ		
20	විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම			
20.1.	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ		

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. MTR/A/DS/2/21/26

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2022 මැයි 30 දින

දිස්ත්‍රික් ලේකම්
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
මාතර

මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මාතර දිස්ත්‍රික් ලේකම් කර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි 20 දින නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළයුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තිය විනිශ්චය සහ වෘත්තිය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය සහ අන්තර්ගතය සඳහා භාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශයන් සමාලෝචිත වර්ෂය තුළ ද ක්‍රියාත්මක කර නොතිබුණි.

ඡේදයට යොමුව	විගණන නිරීක්ෂණය	නිර්දේශය
1.6.1.(ඇ)	සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර මුද්‍රිත පිටපත් හා මූල්‍ය ප්‍රකාශනයන්හි මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ සඳහන් වත්කම් ඒකක 08 ක ආරම්භක ශේෂයන් අතර, රු.මිලියන 788.63 ක වෙනසක් පැවතුණි.	මෙම වෙනස්කම් කඩිනමින් නිවැරදි කරගත යුතුය.
2.6(ආ) (i)	කිසියම් කාර්යයක යෙදවීමේ අදහසින් මොනම හේතුවක් නිසා වුවද නියමිත දිනට කලින් ගෙවීම් නොකළ යුතු වුවද වැය විෂයයන් 02 කට අදාළව බිල්පත්වල වටිනාකමට වඩා වැඩිපුර ගෙවූ රු.8,248 ක් මූල්‍ය ප්‍රකාශනවලට ගලපා නොතිබුණි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.1.1 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂය අවසානයේ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් වත්කම් ඒකක 2 ක ශේෂයන් භාණ්ඩාගාර 82 හි ආරම්භක ශේෂ සමඟ සැසඳීමේදී රු.241,616,032 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) භාණ්ඩාගාර වගු 82 අනුව වර්ෂය තුළ මිලදී ගත් මූල්‍ය නොවන වත්කම්වල එකතුව රු.16,053,453 ක් හා වර්ෂය තුළ අපහරණය කරන ලද එකතුව රු.73,629,876 ක් වූ මූල්‍ය නොවන වත්කම් ඒකාබද්ධ සිගාස් වාර්තාවේ ඇතුළත්වී නොතිබුණි.

(ඇ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 හි මූල්‍ය නොවන වත්කම් සංචලනය පිළිබඳව පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2021 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළව කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය නොවන වත්කම් සංචලන වාර්තාවේ කේත අංක 6112103 යටතේ අංක SPLK 0287 දරන වතුර බවුසරයේ මිලදීගත් අගය ලෙස රු.1,500,000 ක් දක්වා තිබුණ ද 2012 ජුනි 28 දින මිලදී ගත් මෙම බවුසරයට අදාළව ඉන්වොයිස් වටිනාකම රු.4,383,929 ක් බව ගොනුව පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. ඒ අනුව මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම රු.2,883,929 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ii) කාර්යාලයේ පවතින වාහන ලේඛනයට අනුව දිස්ත්‍රික් ලේකම්ට අයත් අංක spCAY 3512 දරන මෝටර් රථයෙහි වටිනාකම 2021 දෙසැම්බර් 31 දිනට කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත ඉදිරිපත් කර තිබුණු වාර්තාවට හා මූල්‍ය නොවන වත්කම් සංචලන වාර්තාවට ඇතුළත් කර නොතිබුණි.

(iii) පස්ගොඩ හා මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 හි ඉඩම් ප්‍රමාණය හා වටිනාකම තක්සේරු කර නොතිබුණු බැවින් මූල්‍ය නොවන වත්කම් සංචලන වාර්තාවේ ඉඩම්වල වටිනාකම අඩුවෙන් දක්වා ඇති බව නිරීක්ෂණය විය.

1.6.1.2 අග්‍රිම ගිණුමේ ශේෂය

සමාලෝචිත වර්ෂය අවසන් දිනට අග්‍රිම ලැබීම් හා ගෙවීම් ලෙස භාණ්ඩාගාර මුද්‍රිතය අනුව රු.6,058,365,435 ක් සටහන් වී තිබුණ ද ඒ.සී.ඒ.3 අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශයෙහි අග්‍රිම ලැබීම් හා ගෙවීම් රු.5,976,835,435 ක් ලෙස දක්වා තිබුණි. එම වෙනසට හේතු මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කර නොතිබුණි.

1.6.2 **ලේඛන හා පොත්පත් පවත්වා නොමැතිවීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පවත්වාගෙන යායුතු නිල නිවාස පිළිබඳ පොරොත්තු ලේඛනය හා වාහන ලොග් පොත් විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

1.6.3 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 අප්‍රේල් 22 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 03 ඡේදය අනුව බැඳීම්, බැරකම් පියවීමේ ක්‍රියාවලිය ආවරණය වන පරිදි CIGAS ගිණුම්කරණ පද්ධතිය යාවත්කාලීන කර ඇති බැවින් බැඳීම් හා බැරකම් සම්බන්ධ තොරතුරු CIGAS වැඩසටහනට ඇතුළත් කිරීමට පියවර ගතයුතු බව දක්වා තිබුණි. ඒ අනුව විගණනය වෙත ඉදිරිපත් වූ මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනට රු.561,152 ක් වූ බැරකම් සම්බන්ධයෙන් වූ භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද CIGAS පරිගණක වාර්තාව විගණනයට ඉදිරිපත් නොවීය.

(ආ) ඉහත චක්‍රලේඛයේ 04 ඡේදය අනුව යම්කිසි නිශ්චිත දිනකට එක් එක් වියදම් ශීර්ෂ සඳහා වූ බැඳීම් හා බැරකම් ප්‍රමාණය හඳුනා ගැනීම සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් ඒ සඳහා වෙන්වූ තොරතුරු පද්ධතියක් නඩත්තු කරන බැවින් එම තොරතුරු පද්ධතිය දිනපතා යාවත්කාලීන කිරීම සඳහා සෑම වියදම් ඒකකයක් විසින්ම දිනපතා තම බැඳීම් හා බැරකම් පිළිබඳ තොරතුරු රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ පවත්වාගෙන යන වෙබ් අඩවියට උත්පනය (Upload) කළයුතු බව දක්වා තිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් එසේ කටයුතු කරන බවට අදාල වූ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඇ) 2017 දෙසැම්බර් 22 දිනැති අංක 263/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 03 ඡේදය අනුව වාර්ෂික අයවැය ප්‍රතිපාදන කාර්තුමය පදනමින් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමට අදාලව 2018 වර්ෂයේ සිට බැඳීම්, බැරකම් හා වියදම කාර්තුමය පදනමින් ගිණුම්ගත කළ හැකි වන සේ CIGAS වැඩසටහන හඳුන්වාදී ඇති බව දක්වා ඇත. ඒ අනුව පිළියෙල කරන ලද කාර්තුමය බැඳීම්, බැරකම් පිළිබඳ වාර්තාව විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඈ) වාහන ලේඛනයේ ඇතුළත් අංක 6696 දරන ට්‍රැක්ටර් රථය 2022 මාර්තු 22 දින සිදුකළ විගණන භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය වූයේ භාවිතයෙන් තොරව එය දිස්ත්‍රික් ලේකම් කාර්යාල භූමියෙහි ගාල්කර ඇති බවයි. මෙම ට්‍රැක්ටර් රථය පිළිබඳ තොරතුරු කිසිවක් විගණනයට ඉදිරිපත් නොවුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 අග්‍රිම කළමනාකරණය

සමාලෝචිත වර්ෂය සඳහා රු.8,138,542,000 ක ප්‍රතිපාදනයක් ඉල්ලුම් කර තිබුණු අතර රු.5,589,488,000 ක ප්‍රතිපාදනයක් ලැබී තිබුණි. ඉල්ලුම් කළ අග්‍රිමයට වඩා රු.2,549,054,000 ක් අඩුවෙන් අග්‍රිම ලැබී තිබූ අතර එය රු.54,596,000 ක හා රු.464,605,000 ක පරාසයක හෙවත් සියයට 13 හා සියයට 49 ක පරාසයක පැවතුණි.

2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූලධන වැය විෂයයන් 04 කට අදාළව මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 16 සිට සියයට 92 දක්වා පරාසයක ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් තොරව ඉතිරි වී තිබුණි. නිසි පරිදි ඇස්තමේන්තු සකස් නොකිරීම හා ලබාදී තිබූ ප්‍රතිපාදන නිසි පරිදි උපයෝජනය නොකිරීම නිසා මෙලෙස ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

(ආ) වැය විෂයයන් 08 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා වෙනත් වැය විෂයයන් 19 කින් සියයට 3 සිට සියයට 52 දක්වා පරාසයකින් ප්‍රතිපාදන මාරුකර වියදම් දරා තිබුණි.

(ඇ) වැය විෂයයන් 19 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම නිසා එම ප්‍රතිපාදනයන්ගෙන් සියයට 0.06 සිට සියයට 87 දක්වා පරාසයකින් ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ට මාරු කිරීමට කටයුතු කර තිබුණි.

2.3 සීමා ඉක්මවීම්

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 503(2) ප්‍රකාරව අත්තිකාරම් ගිණුම්වල නියමිත සීමාවන් ඇතුළත ක්‍රියාකරමින් සීමාවල ඉක්මවීම්/පහත වැටීම් ඇතිවීම වළකාලීමට කටයුතු කරන ලෙස දෙපාර්තමේන්තුවලට තරයේ නියම කර ඇති නමුත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමෙහි අවම ලැබීම් සීමාවට රු.5,437,218 කින් ලහාවී නොතිබුණි.

2.4 බැරකම් හා බැඳීම්වලට එළඹීම

කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් වැය විෂය අංක 1402 හා 1403 ට අදාලව සමාලෝචිත වර්ෂයේදී බැරකම් ලෙස දැක්විය යුතු වටිනාකම පිලිවෙලින් රු.7,893 ක් හා රු.9,228 ක් බැරකම් ලෙස දක්වා නොතිබුණි. එම නිසා බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

2.5 **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

අමාත්‍යාංශ 29 කින්, දෙපාර්තමේන්තු 21 කින් හා වෙනත් ආයතනයකින් සමාලෝචිත වර්ෂය අවසන් වනවිට පිළිවෙලින් රු.3,580,885,348 ක්ද, රු.1,332,044,911 ක්ද හා රු.387,680 ක්ද ලෙස එකතුව රු.4,913,317,939 ක ප්‍රතිපාදන ලැබී තිබුණි. එම ප්‍රතිපාදනවලින් සමාලෝචිත වර්ෂය අවසන් වනවිට පිළිවෙලින් රු.2,991,952,851 ක්ද, රු.1,210,090,233 ක්ද හා රු.387,680 ක්ද ලෙස එකතුව රු.4,202,430,764 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව පිළිවෙලින් රු.588,932,498 ක්ද, රු.121,954,679 ක්ද ලෙස ප්‍රතිපාදනයෙන් එකතුව රු.710,887,175 ක් ඉතිරිවී තිබූ අතර එය පිළිවෙලින් සියයට 16 ක් හා සියයට 9 ක්ද ලෙස එකතුව සියයට 14 ක් විය.

2.6 **ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතිකවීම**

විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදුවන බවට ගණන්දීමේ නිලධාරී විසින් සහතික වියයුතු වුවත්, වාර්තාවේ 3.5 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබාදී නොතිබුණි.

2.7 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නීති,රීති හා රෙගුලාසි යනාදියට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.4 ඡේදය හා 4.5 ඡේදය	රජයට අයවිය යුතු මුදල් ප්‍රධාන ණයකරුගෙන් අයකරගත නොහැකි අවස්ථාවලදී අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග අනුගමනය නොකිරීම නිසා දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වැඩ තහනම් කළ නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.40,915 ක් ද, කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය හැරගිය නිලධාරියෙකු ගෙන් අයවිය යුතු රු.46,937 ක් ද අයකරගෙන නොතිබුණු අතර එම ණය ශේෂයන් වසර 05 කට අධික කාලයක් නිරවුල් නොවී පැවතුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි

(i) මුදල් රෙගුලාසි 94	බැරකම්වලට බැඳීමට ප්‍රතිපාදන සලසා තිබුණද වැය විෂය අංක 1402 හා 1403 අදාළව සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.17,121 ක් වූ බැරකම් හඳුනා ගැනීමකින් තොරව 2022 වර්ෂයේ ප්‍රතිපාදන මගින් ගෙවීම් කිරීමට කටයුතු කර තිබුණි.
(ii) මුදල් රෙගුලාසි 136,137,138 හා 215(1)	ඇස්තමේන්තු කරන ලද වටිනාකම් දක්වමින් ගෙවීම් වවුචර් සකස් කර ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14 ක් විසින් එකතුව රු.668,424 ක් ගෙවා තිබීම හේතුවෙන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු බැරකම් වටිනාකම නිසිපරිදි නිරූපනය නොවීය.
(iii) මුදල් රෙගුලාසි 1645(අ)	වාහන භාර නිලධාරියා විසින් තමා භාරයේ ඇති එක් එක් වාහනය වෙනුවෙන් තම කාර්යාලයේ 267 වැනි පොදු ආකෘති පත්‍රයේ ආකාරයට වාහන ලොග් සටහන් පොතක් තබාගෙන, එය යාවත්කාලීනව පවත්වාගෙන යායුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි.
(iv) මුදල් රෙගුලාසි 1646	වාහන භාර නිලධාරීන් විසින් වාර්තාව ඉදිරිපත් කරනු ලබන මාසයට පසු ඊලඟ මාසයේ 15 වැනි දිනට ප්‍රථමයෙන් ගමන් පිළිබඳ මාසික සාරාංශ ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු නමුත් දිස්ත්‍රික් ලේකම් විසින් භාවිතා කරනු ලැබූ වාහන 2 සම්බන්ධව එසේ කටයුතු කර නොතිබුණි.

(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය	සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාල සීමාවකින්ම පසුව හෝ කිලෝමීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළයුතු අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු වාහන 16 න් 15 කම එවැනි පරීක්ෂාවක් සිදුකර නොතිබුණි.

2.8 අවිධිමත් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රු.3,835,015 ක වියදමක් දරා ස්ථාපිත කර තිබූ විදුලි සෝපානය 2022 පෙබරවාරි මස වනවිටත් ක්‍රීය තත්ත්වයේ පැවති අතර මෙම ව්‍යාපෘතියට අදාළ රැඳවුම් මුදල් ද නිදහස් කර තිබුණි. වර්තමානය වනවිට සේවා නියෝජිත ආයතනය තම වගකීම පැහැර හරින තත්ත්වයක් යටතේ මේ දක්වා මේ සඳහා දරා ඇති රු.4,608,657 ක වියදම ඵලදායී නොවන වියදමක් වී පැවතුණි.

(ආ) මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් මාතර කොටුව මහින්ද විජේසේකර ක්‍රීඩාංගනයේ නඩත්තු හා භාරකාරිත්වය 2018 මැයි 22 දින සිට 2020 නොවැම්බර් 09 දින දක්වා මාතර දිස්ත්‍රික් ලේකම් ක්‍රීඩා සංගමය වෙත පවරා තිබූ අතර 2021 දෙසැම්බර් වන විට විදුලි බිලෙහි රු.92,112 ක හා ජල බිලෙහි රු.24,823 ක හිඟයක් පැවති බව නිරීක්ෂණය විය. විදුලි බිලෙහි හා ජල බිලෙහි මෙපමණ හිඟ මුදලක් පැවතීමට හේතු පරීක්ෂා කර එය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.9 තැන්පතු

(අ) එකතුව රු.69,576,920 ක් වූ වසර 02 ක් ඉක්මවූ තැන්පතු 290 කට අදාළ ශේෂයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. ඉන් රු.8,110,371 ක් වූ තැන්පතු 22 ක් වසර 05 ඉක්මවා තිබුණි.

NATIONAL AUDIT OFFICE OF SRI LANKA

2.10 බැංකු ගිණුම් මෙහෙයවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 136, 137, 138 හා 139 ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා 2021 දෙසැම්බර් 31 දින වන විට නිකුත් කරන ලද නමුත් 2022 මැයි 04 දින වන විටත් ගෙවීමට ඉදිරිපත් නොවූ රු.3,444,830 ක් වටිනා චෙක්පත් 56 ක් පැවතුනි.

(ආ) නිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් අංක 7041886 බැංකු ගිණුමට අදාළව පිළියෙල කරන ලද 2022 පෙබරවාරි මස බැංකු සැසඳුම අනුව 2021 සැප්තැම්බර් 23 දින ගිණුමට තැන්පත් කළ රු.3,885 ක මුදලක් හඳුනා ගැනීමෙන් තොරව දිගින් දිගටම බැංකු සැසඳුම් තුළ ඉදිරියට ගෙනඑමින් පැවතුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1. කාර්යසාධනය

3.1.1 සැලසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුල ගොඩනැගිලි හා ඉදිකිරීම් (2104) සඳහා ව්‍යාපෘති 13 ක් වෙනුවෙන් රු.මිලියන 120 ක ප්‍රතිපාදනයක් සලසා තිබුණි. ඉන් සමාලෝචිත වර්ෂය අවසන් වනවිට රු.මිලියන 9.628 ක වියදමක් දරා තිබුණ අතර රු.මිලියන 110.372 ක ඉතිරියක් වී තිබුණි.

(i) ගොඩනැගිලි හා ඉදිකිරීම් වැය විෂය අංක 262-1-1-0-2104 මගින් පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 23.68 ක ප්‍රතිපාදනයක් ලැබී තිබුණ අතර සමාලෝචිත වර්ෂය අවසන් වනවිට ඉන් රු.මිලියන 0.056 ක් පමණක් වියදම් කිරීම නිසා රු.මිලියන 23.624 ක් ඉතිරිවී තිබුණි. එය සමස්ත වැය විෂයයෙහි ඉතිරියෙන් සියයට 21 ක් වී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට පිළියෙල කර තිබූ ප්‍රගති වාර්තාව අනුව එහි භෞතික ප්‍රගතිය සියයට 14 ක් ලෙස සඳහන් කර තිබුණි.

(ii) මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් ඉහත වැය විෂයය මගින් රු.මිලියන 29 ක ප්‍රතිපාදනයක් සලසා තිබුණ අතර සමාලෝචිත වර්ෂය අවසානයට ඉන් රු.මිලියන 0.793 ක් පමණක් වියදම් දරා තිබුණි. ඉන් රු.මිලියන 28.21 ක ඉතිරියක් නිරීක්ෂණය වූ අතර එය එම වැය විෂයයෙහි සමස්ත ඉතිරියෙන් සියයට 26 ක් වී තිබුණි.

NATIONAL AUDIT OFFICE OF SRI LANKA

(iii) දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම හා පැරණි හා නව ගොඩනැගිලි සම්බන්ධ කිරීම සඳහා එකතුව රු.මිලියන 13 ක ප්‍රතිපාදන සහ තිහගොඩ, මාලිම්බඩ හා දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විදුලි සෝපාන සවිකිරීම සඳහා රු.මිලියන 15 ක ප්‍රතිපාදනයක් ලැබී තිබුණු අතර ඉන් කිසිදු වියදමක් සමාලෝචිත වර්ෂය තුළදී සිදුකර නොතිබුණි.

(iv) අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 20 ක ප්‍රතිපාදනයක් ලැබී තිබුණු අතර වියදම් දරා තිබුණේ රු.මිලියන 0.449 ක් පමණි. රු.මිලියන 19.551 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබූ අතර එය එම වැය විෂයයෙහි සමස්ත ඉතිරිය වන රු. මිලියන 110.372 න් සියයට 18 ක් වී තිබුණි.

3.1.2 ආරම්භ කර නොතිබුණු ව්‍යාපෘති

සෞභාග්‍යා ගම්මාන 2021 වැඩසටහන යටතේ පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කිතුල් ආශ්‍රිත නිෂ්පාදන ව්‍යාපෘතිය රු.2,185,044 ක ප්‍රතිපාදන යටතේ කළුබෝවිටිය ගම්මාන ආශ්‍රිතව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ නමුත් 2021 දෙසැම්බර් මාසය වන විටත් ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි.

3.2 වත්කම් කළමනාකරණය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් අංක JY – 6566 දරන ත්‍රිරෝද රථය අළුත්වැඩියාවකින් තොරව දිස්ත්‍රික් ලේකම් කාර්යාල භූමියේ නිෂ්කාර්යව ගාල්කර තිබූ අතර 2015 ජූලි 10 දිනැති අංක 02/2015 මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය ආයතනවල අබලන් වූ වාහන භාවිතයෙන් ඉවත් කිරීම සම්බන්ධව කටයුතු කර නොතිබුණි.

3.3 රජයේ නිලධාරීන්ගේ ඇප තැබීම.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව රජයේ මුදල්, ආදායම් මුද්දර හෝ බඩු බාහිරාදිය භාර ගැනීම හෝ භාරව සිටීම, එසේ නැතහොත් රජයේ මුදල් බෙදාහැරීම හෝ මුද්දර නැතහොත් බඩුබාහිරාදිය නිකුත් කිරීම සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිවයුතු හෝ බලය පැවරීම යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති හෝ නිලධාරීන් ද, රජයේ ගිණුමට අදාළ වවුචර්, සහතික කරන චෙක්පත් අත්සන් කරන අයද ස්වකීය රාජකාරි කටයුතු අවංකව ඉටුකරන බවට 612 වැනි අධිකාරය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව හා මුදල් රෙගුලාසි 881 ප්‍රකාරව ඇප තැබිය යුතු තනතුරකට නිලධාරියෙකු පත්කිරීමේදී හෝ මාරු කිරීමේදී අදාළ නිලධාරියා විසින් එම තනතුරට පත්කළ දින සිට දෙමසක් ඇතුළත ඇප තැබිය යුතු වුවත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල එසේ කටයුතු කර නොතිබුණි.

3.4 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල තව දුරටත් ක්‍රියා කිරීමට ඇති හානි පාඩු ලෙස දක්වා ඇති එකතුව රු.932,408 ක් වූ හානි හා පාඩු ශේෂයන් 3 ක් රක්ෂණය මගින් ප්‍රතිපූර්ණය කිරීම්, වැරදිකරුවන්ගෙන් අයකර ගැනීම්, පොත්වලින් කපාහැරීමට අනුමැතිය ලැබීම ආදිය සිදුකර ඇතත් 2022 මාර්තු 31 දක්වා ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) එකතුව රු.196,278 ක් වූ හානි පාඩු සමාලෝචිත වර්ෂයේ හානි පාඩු ලේඛනයේ ඇතුළත් කර තිබූ නමුත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර නොතිබුණු අතර එම හානි පාඩු සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව ඉදිරි කටයුතු සිදුකර නොතිබුණි.

(ඇ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් එකතුව රු.9,391,713 ක් වූ හානි හා පාඩු 02 ක් සහ මාතර හා වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් එකතුව රු.2,615,637 ක් වූ හානි පාඩු 02 ක් ඇතුළුව මුළු එකතුව රු. රු12,007,350 ක් වූ හානි හා පාඩු සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කර තිබූ නමුත් හානි හා පාඩු ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි.

(ඈ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හානි පාඩු සම්බන්ධයෙන් පවත්වාගෙන යනු ලබන ගොනු පරීක්ෂාවේදී හානි පාඩු ලේඛනයේ සහ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් නොවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 2 කට අදාලව 2019 හා 2021 වර්ෂවලදී සිදුවූ අලාභ හානි 3 ක් පැවති බව නිරීක්ෂණය විය.

3.5 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 7 කට හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ඉදිරිපත් කරන ලද විගණන විමසුමකට අදාළව විගණන දිනය වූ 2022 මැයි 05 දින වනවිටත් පිළිතුරු ලැබී නොතිබුණි.

3.6 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) (i) විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2008 ඔක්තෝබර් 03 දිනැති අංක 9/2008 චක්‍රලේඛය, 2010 මාර්තු 30 දිනැති අංක 9/2008 (සංශෝධන) චක්‍රලේඛය, 2018 ජූලි 17 දිනැති අංක 9/2008 (සංශෝධන II) චක්‍රලේඛය හා 2019 මැයි 09 දිනැති විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි අංක 6/2019 අනුව හමුදා සේවා හා දුබලතා විශ්‍රාම වැටුප් (59,6) ඒකාබද්ධ කර නොගෙවීම නිසා නියැදි පරීක්ෂාව අනුව මාතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක විශ්‍රාමිකයින් 19 දෙනෙකු වෙත රු.2,748,197 ක් 2014 ජුනි සිට 2021 දෙසැම්බර් දක්වා කාලයට අදාළව වැඩිපුර ගෙවා තිබුණි.

NATIONAL AUDIT OFFICE OF SRI L

(ii) යථෝක්ත චක්‍රලේඛයේ 3 ඡේදය හා 2014 නොවැම්බර් 03 දිනැති අංක 13/2014 චක්‍රලේඛයේ 3 ඡේදය ප්‍රකාරව විශ්‍රාම වැටුප් කිහිපයක් ඒකාබද්ධව ලබාගන්නා විට ඒකාබද්ධ විශ්‍රාම වැටුපට පමණක් අන්තර් දීමනාව ලබාදිය යුතු වුවද නියැදි පරීක්ෂාව අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක විශ්‍රාම වැටුප්ලාභීන් දෙදෙනෙකුට යැපීම් දීමනා (4) හා හමුදා සේවා වැන්දඹු විශ්‍රාම වැටුප (40) යටතේ අන්තර් දීමනා ලෙස රු.342,000 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) 2019 වර්ෂයේ ක්‍රියාත්මක වූ ගම්පෙරලිය ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ රු.471,679 ක් වැයකර ඉදිකර තිබූ සමගි මාවත 4 වන හරස්පාර නිවැසියන්ගේ අවශ්‍යතාවයට ගැලපෙන පරිදි සකස් නොකිරීම නිසා ජලය බැසයාමේ ක්‍රමවේදයක් නොමැතිවීම හේතුවෙන් වර්ෂාව අවස්ථාවේදී වැසි ජලයෙන් මාර්ගය යටවන අතර මෙම ජලය බැස්සවීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් වගකිවයුතු ආයතන විසින් ලබාගෙන නොතිබුණි.

(ඇ) දිවිනැඟුම සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි දිවිනැඟුම ව්‍යාපාරික සංගම් ශක්තිමත් කිරීම හා එම සංගම් තුලින් අලෙවි සංවර්ධන වැඩසටහන් සම්බන්ධීකරණය හා ඉලෙක්ට්‍රොනික/පරිගණක තාක්ෂණවේදය මගින් අලෙවි සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම සම්බන්ධීකරණය සඳහා පත්කර තිබූ නිලධාරියෙකු 2020 මාර්තු 02 දින සිට දකුණු පළාතේ සියළුම දිස්ත්‍රික්කවල විගණන කටයුතු අධීක්ෂණය කිරීමේ කාර්යය සඳහා පත්කර තිබූ අතර ඔහුගේ සේවා ස්ථානය, ඔහුගේ ඉල්ලීම පරිදි මාතර දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය වී තිබුණි. මෙම නිලධාරියා හට විධිමත් පත්වීමේ ලිපියක් හා නිශ්චිත රාජකාරී පැවරීමක් ද නොවූ අතර දකුණු පළාත වෙනුවෙන්ම රාජකාරී ඉටුකිරීම සඳහා පත්කර තිබුණද ඔහුගේ රාජකාරී මාතර දිස්ත්‍රික්කයට පමණක් සීමාවීම තුලින් මෙම සේවයට පත්කිරීමේ අරමුණ ඉටුවී නොතිබුණි.

(ඈ) (i) තුවක්කු ආඥා පනතේ අංක 22(2)(උ) වගන්තිය අනුව ගිනිඅවි බලපත්‍රයක වලංගුභාවය අහෝසි වී සන්තකයේ තබාගත හැකි කාලසීමාව දින 10 ක් වන අතර බලපත්‍ර රහිතව දින 10 කට වැඩි කාලයක් එම ගිනි අවි සන්තකයේ තබාගැනීම අදාළ පනත යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් වුවත් විගණිත දිනය වූ 2022 පෙබරවාරි 10 දින වනවිට මාතර දිස්ත්‍රික්කයේ ගිනි අවි හිමිකරුවන් 14 දෙනෙකු සතු ගිනි අවි සඳහා වසර 01 සිට 05 ක කාල පරාසයක් තුළ බලපත්‍ර අළුත් කර නොතිබුණු අතර එම බලපත්‍ර රහිත ගිනිඅවි නැවත භාරදීමට කටයුතු කර නොතිබුණ ද ඒ සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ii) ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්ගේ අංක 6/2020 සහ 2020 අගෝස්තු 26 දිනැති චක්‍රලේඛයේ 10.1 ඡේදය ප්‍රකාරව නියමිත කාලසීමාව තුළ ගිනි අවි බලපත්‍ර අළුත් කිරීම පැහැර හරින ගිනි අවි බලපත්‍රලාභීන් සම්බන්ධ තොරතුරු ගිනිඅවි ආඥා පනත යටතේ නෛතික ක්‍රියාමාර්ග ගැනීමට අදාළ කොට්ඨාශ භාර පොලිස් අධිකාරී වෙත යොමුකර ආරක්ෂක අමාත්‍යාංශ ලේකම් වෙත වාර්තා කළයුතු වුවද විගණිත දිනය වූ 2022 පෙබරවාරි 10 දින දක්වාම අදාළ තොරතුරු කොට්ඨාශ භාර පොලිස් අධිකාරීවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. එසේ හෙයින් තුවක්කු ආඥා පනත යටතේ අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වී තිබුණි.

NATIONAL AUDIT OFFICE OF SRI LANKA

(iii) 2018 සැප්තැම්බර් 26 දිනැති ආරක්ෂක අමාත්‍යාංශ අතිරේක ලේකම්ගේ අංක MOD/CFS/12/FA/14 දරන ලිපියේ 3 ඡේදය අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත භාරගනු ලබන අබලන් හෝ පාවිච්චියට නුසුදුසු ගිනිඅවි, ආසන්න පොලිස් ස්ථාන වෙත යොමුකර ඒ මගින් සුදුසු කටයුතු කිරීම සඳහා පොලිස් ක්ෂේත්‍ර බලකා මූලස්ථානය වෙත යොමුකළ යුතු වුවද 2020 හා 2021 වර්ෂවල රජයට භාරගන්නා ලද ගිනිඅවි 10 ක් විනාශ කළයුතු බවට තක්සේරු මණ්ඩලය මගින් නිර්දේශ කර තිබියදී 2022 පෙබරවාරි 11 දින දක්වා මේ සම්බන්ධව සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඉ) (i) දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක සෞභාග්‍යා නිෂ්පාදන ගම්මානවල පොදු යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති අතුරින් කෝට්ටගොඩ උම්බලකඩ හා කරවල නිෂ්පාදන කර්මාන්ත ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා අනුමත වී තිබූ රු.6,000,000 ක මුදලින් අදියර 2 ක් යටතේ මෙම ව්‍යාපෘතිය ඉටුකිරීමට 2021 දෙසැම්බර් 16 දින ග්‍රාම සංවර්ධන සමිති 2 ක් සමඟ ගිවිසුම්ගතවී තිබුණ ද 2022 පෙබරවාරි 23 දින විගණන භෞතික පරීක්ෂාව වනතෙක්ම ගොඩනැගිල්ලේ අත්තිවාරම දක්වා කොන්ක්‍රීට් කණු 24 ක් පමණක් ඉදිකර තිබූ අතර එම කණු සඳහා යෙදූ කම්බි මල කැමට ලක්වී තිබූ බව නිරීක්ෂණය විය. විගණන අවස්ථාව වනවිටත් කොන්ත්‍රාත්තුව අවසන් කිරීම සඳහා දින දීර්ඝ කර ගැනීමට ද කටයුතු කර නොතිබුණි.

(ii) යටෝක්ත වැඩසටහන යටතේ ක්‍රියාත්මක මැල්පුර සුසාන භූමියට යන පාර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය රු.309,532 ක ඇස්තමේන්තුගත මුදලකට ඉටුකර දීම සඳහා දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා සමඟ ඇතිකර ගත් අවබෝධතා ගිවිසුම ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා ප්‍රජා සංවර්ධන සමිතියත් සමඟ කොන්ත්‍රාත්තුව සඳහා ගිවිසුම්ගතවී තිබුණි. මාර්ගය සම්බන්ධයෙන් සිදුකළ විගණන භෞතික පරීක්ෂාවට අනුව මීටර් 38 ක් දිග මාර්ගයෙහි ඇස්තමේන්තු වැඩ විෂය අංක 4 ප්‍රකාරව සෑම මීටර් 3 කටම ප්‍රසාරණ මූට්ටු (expansion joints) යෙදිය යුතු වුවත් මෙම මාර්ගය සඳහා යොදා තිබුණේ ප්‍රසාරණ මූට්ටු 3 ක් පමණි. ඇස්තමේන්තු ප්‍රකාරව කොන්ක්‍රීට් කුට්ටි පරීක්ෂාවක් සිදුකිරීම ද කර නොතිබුණු අතර ඇස්තමේන්තු ප්‍රකාරව මාර්ගයේ උස මිලි මීටර් 150 වියයුතු වුවත් මාර්ගය මැද පහත් වන ආකාරයට ඉදිකර තිබුණි.

(iii) යටෝක්ත වැඩසටහන යටතේම ගොඩැල්ලවත්තේ සිට පෙත්තරේ පාරට වැටෙන කාණු පද්ධතිය සැකසීමේ ව්‍යාපෘතිය සඳහා රු.487,790 ක වටිනාකමක් යටතේ ප්‍රජා සංවර්ධන සමිතියක් සමඟ 2021 දෙසැම්බර් 15 දින ගිවිසුම්ගතවී තිබුණ ද 2021 දෙසැම්බර් 25 දිනට පෙර අවසන් කළයුතු වූ ව්‍යාපෘතිය 2022 පෙබරවාරි 24 දින විගණන භෞතික පරීක්ෂාව වනවිටත් අවසන් කර නොතිබුණි. අදාළ කාණුව ඉදිකිරීම සඳහා මාර්ගය මධ්‍යය කපා කම්බි පමණක් යොදා තිබූ අතර කම්බි මල බැඳීමට ලක්ව තිබුණු අතරම මාර්ගයේ ගමන් කරන්නන්ට ද මෙලෙස මාර්ගය මධ්‍යයේ කාණුව කපා තිබීම ගමනාගමනයට බාධාවක් බව නිරීක්ෂණය විය.

(iv) යටෝක්ත වැඩසටහන යටතේම ක්‍රියාත්මක කර තිබූ මැටි කර්මාන්තය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය රු.757,160 ක මුදලකට ඉටුකිරීමට ප්‍රජා සංවර්ධන සමිතියක් සමඟ ගිවිසුම්ගතවී තිබූ අතර 2021 දෙසැම්බර් 28 දිනට ව්‍යාපෘතිවල වැඩ අවසන් බවට කොන්ත්‍රාත්කරු ලිඛිතව දන්වා තිබුණ ද 2022 පෙබරවාරි 24 විගණන භෞතික පරීක්ෂාව වනවිටත් ඉටු නොකරන ලද කාර්යයන් පැවති බව නිරීක්ෂණය විය. මෙහි ඇස්තමේන්තු විෂය අංක G 1 ප්‍රකාරව සෙවිලි තහඩු සහ ආනයනික දැව සම්පූර්ණයෙන් යොදා වහල නිම කිරීමට රු.195,448 ක් ඇස්තමේන්තු කර තිබියදී නැවත වැඩ විෂය අංක G 2 ලෙස Wall Plate සඳහා රු.106,212 ක් ඇස්තමේන්තු කර තිබුණි. එම G 2 විෂය අංක ප්‍රකාරව 5 x 3 Wall Plate 04 ක් ඉදිකළ යුතු වුවද ඉදිකර තිබුණේ 2 ක් පමණි. මේ ලෙසටම ඇස්තමේන්තු විෂය අංක G 1 ප්‍රකාරව ආනයනික දැව සඳහා කළු හෝ දුඹුරු දැව ආරක්ෂක දෙවරක් ආලේප කර නොතිබුණි.

(ඊ) (i) රජය විසින් ප්‍රදානය කරනු ලබන දීමනාපත්‍ර ඉඩමක පවතින ඛණිජ සම්පත් සම්බන්ධයෙන් වන පැවරුම්කරයෙහි රක්ෂිත වගන්ති අනුව "ඉඩමෙහි හා එහි මතුපිට ඇති සියළු ඛණිජ ද්‍රව්‍ය පිළිබඳ හිමිකම් හා එවැනි යම් ඛණිජ ද්‍රව්‍ය හැරීමේ, සෙවීමේ, ඒ පිළිබඳව කටයුතු කිරීමේ හා බැහැර ගෙන යාමේ අයිතිය රජය වෙත වෙන්කර තබාගනු ලැබේ" යනුවෙන් සඳහන් වුවද, අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙහි රජයේ දීමනා පත්‍ර සහිත ඉඩම් කැබලි 5 ක කළුගල් කැණීම සඳහා පෞද්ගලික ඉල්ලුම්කරුවන් වෙත අවසර ලබාදී තිබුණි. රජය සතුව පවතින හිමිකම වෙනත් පුද්ගලයෙකු වෙත ලබාදෙන්නේ නම් ඉඩම් සම්බන්ධයෙන් රජයට යම් ගාස්තුවක් අයකර ගැනීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය කටයුතු කළයුතු වුවද එසේ කර නොතිබුණි.

(ii) භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මගින් නිකුත් කරන ලද කැනීම් බලපත්‍රයේ පනවා ඇති කොන්දේසි ප්‍රකාරව කැනීම් මුහුණතෙහි ඇති අස්ථාවර ගල්කුට්ටි හා කලින් සිදුකළ පිපිරවීම්වලදී ඇතිවූ ගල් නැවත පිපිරවීම් ආරම්භ කිරීමට ප්‍රථම ඉවත් කළයුතු බවටත්, කැනීම් තට්ටු ආකාරයෙන් එක් තට්ටුවක උස මීටර් 10 වන ලෙස ඉටුකළ යුතු බවටත්, කැනීම් සිදුකිරීමේදී ඉඩමේ සියළු මායිම් වටා මීටර් 5 ක බිම් තීරුවක් කැනීමෙන් තොරව අත්හළයුතු බවටත් කැනීම් භූමියෙහි මායිම් කොන්ක්‍රීට් කණු මගින් පැහැදිලිව සලකුණු කර කැනීම් අවසන් වනතුරු පවත්වාගෙන යායුතු බවටත්, කළුගල් ප්‍රවාහනයේදී එම ගල් හොඳින් ආවරණය කළයුතු බවටත් මදුරුවන් බෝවිය හැකි වතුර වලවල් ඇති නොවන පරිදි කැනීම් භූමිය පවත්වාගෙන යායුතු බවටත්, සේවකයින් සඳහා පුද්ගලික ආරක්ෂක උපකරණ ලබාදිය යුතු අතර සේවයේ යෙදී සිටීමේදී ඒවා පිළිපැදිය යුතු බවටත් කරුණු දක්වා තිබුණ ද මාතර, හක්මණ හා අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි විගණන භෞතික පරීක්ෂාවට ලක්වූ ගල් වල හිමියන් විසින් එම කොන්දේසි නිසියාකාරව ඉටුකර නොතිබියදී දිගින් දිගටම කැනීම් බලපත්‍ර නිකුත් කර තිබුණි.

NATIONAL AUDIT OFFICE OF SRI LANKA

(iii) අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 368 B දොල මාවත ග්‍රාම නිලධාරී වසමේ එරනවිලහේන නැමැති රජයේ ඉඩමෙහි පවත්වාගෙන යනු ලබන ගල්කොරිය කිසිදු බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් නොමැතිව මාස තුනකට ආසන්න කාලයක් පවත්වාගෙන ගොස් තිබුණද අදාළ වගකිවයුතු නිලධාරීන්ගේ අවධානය යොමු වී නොතිබුණි. 2021 මාර්තු 01 දිනැති ග්‍රාම නිලධාරී ලිපිය මගින් කළුගල් කැනීම හා ගල්මෝල පවත්වාගෙන යාමට නිර්දේශ ලබාදී තිබූ අතර එම අවස්ථාවේදී ද එම ස්ථානයෙහි ගල්මෝල පිහිටුවා ඇති බව සඳහන් විය. එම නිර්දේශ ලිපිය අනුව පදනම්වී ප්‍රාදේශීය ලේකම් විසින් ද 2021 දෙසැම්බර් 15 දින එම කාර්ය සඳහා අවසර ලබාදෙන බවට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙත දන්වා තිබුණි. විගණන පරීක්ෂාවට ලක්වූ 2022 ජනවාරි 12 දින වනවිට ද එම කළු ගල් කැනීමේ කටයුතු සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මගින් කාර්මික කැනීම් බලපත්‍රය ද මධ්‍යම පරිසර අධිකාරිය විසින් පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ද දිස්ත්‍රික් පුපුරන ද්‍රව්‍ය පාලක විසින් නිකුත් කරන ලද පුපුරන ද්‍රව්‍ය අවසර පත්‍රය ද ලබාගෙන නොතිබුණි. විගණන පරීක්ෂණ අවස්ථාව වනවිට එම ස්ථානයෙහි කළු ගල් කැනීම් සිදු කර ඇති බවට නිරීක්ෂණය වූ ලෙසම ගල් ඇඹරුම් යන්ත්‍රයක්, එක්ස්කැවේටර් යන්ත්‍ර 02 ක් හා කොම්ප්‍රෙෂර් යන්ත්‍රයක් ද පැවති බවත් නිරීක්ෂණය වූ අතර ගල් මෝල ද ක්‍රියාත්මක තත්ත්වයේ පවතින බව නිරීක්ෂණය විය.

(උ) අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අස්මගොඩ හිරුවලහේන ඉඩමේ මුල් අයිතිකරු විසින් ගල් වැඩපලක් ආරම්භ කිරීමට 2005 වර්ෂයේදී ඉල්ලීම් කර තිබූ අතර මධ්‍යම පරිසර අධිකාරිය, සහකාර පුපුරණ ද්‍රව්‍ය පාලක හා ප්‍රාදේශීය පරිසර නිලධාරී විසින් එම ගල් වල පවත්වාගෙන යාමට නුසුදුසු බව ලිඛිතව කරුණු ඉදිරිපත් කර තිබුණි.2017 වර්ෂයේදී පෙර අයිතිකරු මියයාමෙන් පසුව මෙම ඉඩම මිලදීගත් පුද්ගලයා විසින් නැවත ගල්වැඩපලක් ආරම්භ කිරීමට අවසර ඉල්ලා තිබූ අතර පෙර තිබූ හානිදායක තත්ත්වය නොසළකා 2018 වර්ෂයේ සිට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මගින් ගල් කැඩීම සඳහා කැනීම් බලපත්‍රය නිකුත් කර කැනීම් කටයුතු සිදුකර ඇති බව නිරීක්ෂණය විය. 2005 වර්ෂයේ සිට විගණිත දිනය වූ 2021 දෙසැම්බර් 06 දින වනවිටත් මධ්‍යම පරිසර අධිකාරියෙන් මේ සඳහා අවසරපත්‍ර නිකුත් කිරීමක් සිදුකර නොතිබූ අතර හේනෙගම ගම්වාසීන් විසින් අතිගරු ජනාධිපතිතුමා වෙත යොමු කරන ලද පැමිණිල්ල අනුව 2020 දෙසැම්බර් 16 දින මධ්‍යම පරිසර අධිකාරී නිලධාරීන් හා අනෙකුත් නිලධාරීන් විසින් සිදුකරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණයේදී ඉදිරිපත් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කර ඇත්නම් පමණක් ගල් වල සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරන ලෙස දක්වා තිබූ නමුත් එම නිර්දේශ ඉටු කර ඇති බව 2022 ජනවාරි 12 විගණිත දින වනවිටත් තහවුරු නොවුණි.

(ඌ) සපිරිගමක් සංවර්ධන වැඩසටහන - 2020 යටතේ දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් නාඔටුන්න දකුණ ග්‍රාම නිලධාරී වසමේ සමගි මාවත අතුරු පාර සංවර්ධනය කිරීම වෙනුවෙන් දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් දෙවිනුවර ප්‍රාදේශීය සභාව සමඟ අංක DPS/04/01/SG/2020/50 දරන හා 2020 අගෝස්තු 21 දිනැතිව අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණු අතර, කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව කොන්ත්‍රාත්කරු විසින් 2021 ඔක්තෝබර් 21 දින වන විට ව්‍යාපෘතියේ වැඩ අවසන් කර භාර දී නොතිබුණි. දෙවිනුවර ප්‍රාදේශීය සභාව විසින් 2021 දෙසැම්බර් 16 දින ව්‍යාපෘතියේ වැඩ නිමකිරීම සම්බන්ධයෙන් රු.1,428,300 ක් වටිනා ගෙවීම් බිල්පතක්

NATIONAL AUDIT OFFICE OF SRI

ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (1) වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාව විසින් සීමා ලකුණු කර පාරවල් සහ පටු මාවත් පිළිබඳ සැලැස්මවල් පිළියෙල කිරීම හා නාම ලේඛනයක් ගැසට් මගින් පළකරනු ලැබිය යුතු අතර, 24(3) හා 24(4) වගන්තිවල විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීමෙන් පසු ප්‍රාදේශීය සභාව සතු සියළුම පාරවල් හෝ පටු මාවත් මාර්ග ඉන්වෙන්ට්‍රි ලේඛණයට ඇතුළත් කළ යුතු වුවත්, එම විධිවිධානයන්ට අනුකූල නොවී පෞද්ගලික ඉඩමක් තුළ රජයේ අරමුදල් භාවිතා කර මාර්ග සංවර්ධන කටයුතු කිරීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගිවිසුම්ගත වී තිබුණි.

(ii) ඒ අනුව ප්‍රාදේශීය සභාව විසින් පෞද්ගලික ඉඩම්තුළ පවතින මාර්ගයට සමාන්තර නොවන ලෙස සිදුකළ අනවසර ඉදිකිරීම් වෙනුවෙන් වැඩ විෂය අංක 1 සිට 12 දක්වා එකතුව රු.1,152,676 ක් වූ බිල්පත් ඉදිරිපත් කර ඇති බවත්, ඒ තුළින් රජයේ අරමුදල් අවිධිමත් හා නීත්‍යානුකූල නොවන වියදම් දැරීමට අවස්ථාව සලසා ඇති බවත් නිරීක්ෂණය විය.

(iii) ඇස්තමේන්තුවේ වැඩ විෂය අංක 13 යටතේ කොන්ක්‍රීට් කුට්ටිගල් ඇල්ලීම වෙනුවෙන් රු. 271,425 ක් වූ වියදම් බිල්පත් ඉදිරිපත් කර තිබුණු අතර, මාර්ගයේ අතුරා තිබුණු කුට්ටිගල් නියමිත ප්‍රමිතියෙන් තොර බවට, රසායනාගාර පරීක්ෂණ වාර්තා අනුව නිරීක්ෂණය විය. ඒ අනුව කොන්ත්‍රාත්කරු විසින් නියමිත ප්‍රමිතියෙන් යුතුව ඉටු නොකල වැඩ වෙනුවෙන් ගෙවීමට අවශ්‍ය බිල්පත් ප්‍රාදේශීය සභාව විසින් සකස් කර, ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය විය.

(ඒ) 2021 වර්ෂයේදී ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක ග්‍රාමීය ක්‍රීඩාපිටි සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ මුලටියන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද ක්‍රීඩාංගන සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති 02 ක් පිළිබඳ පරීක්ෂාවේදී පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) මුලටියන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කර තිබුණු රදාවෙල හොරමුල්ල ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් රදාවෙල ගොවි සංවිධානයක් සමඟ රු.1,914,323 ක් වූ දින රහිත ගිවිසුමකට එළඹ තිබුණි. ව්‍යාපෘතියට අදාළ ලිපිගොනු හා 2021 දෙසැම්බර් 17 දින ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සිදු කළ ක්ෂේත්‍ර පරීක්ෂාවේදී පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

- ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ සාමාන්‍යාධිකාරි විසින් ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්, මාතර ඇමතූ අංක LD/472 දරන හා 2020 ඔක්තෝබර් 19 දිනැති ලිපිය හා ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ අංක 7/11/19/MA/251 දරන හා 2021 නොවැම්බර් 24 දිනැති ලිපිය ප්‍රකාරව අදාළ ඉඩම සංවර්ධනය කිරීමේදී අනුගමනය කළයුතු කොන්දේසි හා නිර්දේශයන්වලට අනුකූල නොවී ක්‍රීඩාපිටිය ඉදිකිරීම සඳහා

NATIONAL AUDIT OFFICE OF SRI LANKA

ඉඩම සංවර්ධනය කරමින් පවතින බව විගණන ක්ෂේත්‍ර පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

- ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අංක SMRSSII/DD/07/RSO-2-1 දරන හා 2021 මාර්තු 05 දිනැති ලිපියේ ඇමණුම 04 හි සඳහන් මාර්ගෝපදේශයන් අනුව බිම් සකස් කිරීම, පස්, බොරලු සහ පිඩැලි ප්‍රවාහන කටයුතු සඳහා පළාත් පාලන ආයතනයේ යන්ත්‍ර සූත්‍ර හා ශ්‍රම දායකත්වය යොදාගත යුතු අතර, ඒ සඳහා වැයවන ඉන්ධන සඳහා වියදම පමණක් ඇස්තමේන්තුවට ඇතුළත් කළයුතු බවට නියෝග කර තිබුණද, ඊට අනුකූල නොවී ව්‍යාපෘතියේ එම වැඩ ගොවි සංවිධානයකට පවරා ඔවුන් මඟින් වැඩ නිම කර ගැනීම වෙනුවෙන් රු.1,941,323 ගෙවීමට ඇස්තමේන්තු සකස් කර තිබුණි.

- මාර්ගෝපදේශයේ වගන්ති අංක 05 ප්‍රකාරව ක්‍රීඩා භූමියේ අත්‍යාවශ්‍යයෙන්ම කළයුතු සංවර්ධන කටයුතු සිදු කරනු ලබන ක්‍රීඩාවන්ට පොදුවේ භාවිතා කළහැකි පරිදි ක්‍රීඩාංගනය සංවර්ධනය කළයුතු බවට නියෝග කර තිබුණත්, ඊට අනුකූලව ක්‍රීඩාංගනයේ ඉදිකිරීම් සිදුකිරීමට අවශ්‍ය වැඩ විෂයයන් ඇතුළත් කර ඇස්තමේන්තු සකස් කර නොමැති බවත්, භූමියට පස් දමා ගොඩකිරීම පමණක් ව්‍යාපෘතියේ මූලික අරමුණ වී තිබුණු බවත් විගණන ක්ෂේත්‍ර පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

- ඒ අනුව අදාළ මාර්ගෝපදේශයන්ට අනුකූලව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවන බවත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වගකිව යුතු නිලධාරීන් විසින් මුදල් රෙගුලාසි 128(1) (ඒ) ප්‍රකාරව කටයුතු කර නොමැති බවත් වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(ii) මුලටියන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කර තිබුණු පරපාමුල්ල නැගෙනහිර දුගහමලිත්ත ක්‍රීඩාංගනය වොලිබෝල් ක්‍රීඩාපිටියක් ලෙස සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් මුලටියන ප්‍රාදේශීය සභාව සමඟ රු.1,467,946 ක් වූ අවබෝධතා ගිවිසුමකට 2021 මාර්තු 30 දින එළඹ තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ප්‍රාදේශීය සභාව වෙත එකතුව රු.1,321,516 ක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් 2021 දෙසැම්බර් 17 දින කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

- ක්‍රීඩාපිටියේ පැති දෙකක් ආවරණය වන පරිදි මීටර් 1.35 ක් පළලට හා මීටර් 1.65 ක් ගැඹුරට කාණුවක් කපා එය තුළ දැල් ආවරණය ඉදිකර තිබුණි. දැල් ආවරණය මතුපිට භූමියේ සිට පොළව ඇතුළට මීටර් 1.65 ක් යටවී තිබුණු අතර අදාළ කාණුව හේතුවෙන් හා ඇස්තමේන්තු ප්‍රකාරව වොලිබෝල් කනු ස්ථාපිත නොකිරීමෙන් ක්‍රීඩාපිටිය භාවිතයට ගත නොහැකි වී තිබුණි. ඒ අනුව ඇස්තමේන්තු ප්‍රකාරව ක්‍රීඩාපිටිය සකස් නොකිරීම හේතුවෙන් වොලිබෝල් ක්‍රීඩාව සිදුකළ හැකි අයුරින් ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීමට තව දුරටත් රු.900,000 ක් වැයවන බව දක්වමින් මුලටියන ප්‍රාදේශීය සභාව විසින් රු.1,250,000 ක් සහා අරමුදලින් දැරීමට

AUDIT OFFICE OF SRI LA

2021 ඔක්තෝබර් 21 දින සභා තීරණය ගෙන තිබීමෙන් ව්‍යාපෘතිය වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගෙවූ රු.1,321,516 ක් නිශ්කාර්ය වියදම් වී තිබුණු බවට අනාවරණය විය.

- ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අංක SMRSSII/DD/07/RSO-2-1 දරන හා 2021 මාර්තු 05 දිනැති ලිපියේ ඇමණුම 04 හි සඳහන් මාර්ගෝපදේශයන් අනුව ක්‍රීඩාපිටිය ස්ථාපිත කිරීම භූ විද්‍යාත්මක ලක්ෂණ අනුව ගංවතුර, නායයෑම්වලට ලක්වන ස්ථාන නොවිය යුතු විය. කෙසේ වුවද. ක්‍රීඩාපිටිය සකස් කිරීමේදී කපා ඉවත් කරන ලද පස් සන මීටර් 6763 ක් අවධිමත් ආකාරයට බැහැර කර ක්‍රීඩාපිටියේම මීටර් 40 ක් පමණ දුරක සිට ගොඩගසා තිබුණු අතර, වර්ෂාව හේතුවෙන් නාය යෑමට ලක්ව එම පස් සෝදා ගොස් තිබුණු අතර, ඒ හේතුවෙන් අවට පිහිටි රජයේ හා පෞද්ගලික ඉඩම්වලට හානිදායක තත්ත්වයන් ඇති වී තිබුණි.

(ඒ) (i) වේවැල්, පිත්තල, මැටි, ලීබඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ රු.52,123,045 ක ප්‍රතිපාදන මත එක් ග්‍රාම නිලධාරී වසමකට එක් ග්‍රාමීය කර්මාන්ත ව්‍යවසායකයෙක් බිහිකිරීමේ අරමුණ සහිතව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අධීක්ෂණය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මෙහෙයවීම යටතේ විදාතා සම්පත් මධ්‍යස්ථානවල ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවල 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය අනුව මාතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක ග්‍රාම නිලධාරී වසම් 430 න් ග්‍රාම නිලධාරී වසම් 90 ක එක් ව්‍යවසායකයෙකු හෝ බිහිවී නොතිබුණි.

(ii) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 හි අනුමත ප්‍රතිලාභීන් සංඛ්‍යාව 625 ක් වූ අතර,ප්‍රතිලාභීන් 418 දෙනෙකු සඳහා යන්ත්‍ර උපකරණ මිලදීගෙන තිබුණද උපකරණ 255 ක ප්‍රමාණයක් 2021 දෙසැම්බර් 31 දින වන විටද බෙදා දී නොතිබුණි.

(iii) 2021 පෙබරවාරි 25 දිනැති වේවැල්,පිත්තල,මැටි,ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අංක 3/2021 දරන චක්‍රලේඛය හා අංක SMRIP/DEV/VY/10/03/2021(පොදු) ලිපිය අනුව නව ග්‍රාමීය කර්මාන්ත ව්‍යවසායකයින් බිහිකිරීමේ අරමුණ වුවද ඊට අනුකූල නොවී මාතර විදාතා මස්ථානය විසින් තෝරාගත් ප්‍රතිලාභීන් 22 කුගෙන් 19 දෙනෙකු දැනට එම ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යන ප්‍රතිලාභීන් විය.

(iv) 2021 ජූලි 15 දිනැති වේවැල්,පිත්තල,මැටි,ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අංක SMRIP/DEV/VY/10/03/2021(පොදු) ලිපිය අනුව ඇඟලුම්, ආහාර නිෂ්පාදනය, බිම්මල් වගාව ආදී කර්මාන්තයේ නියුතු ප්‍රතිලාභීන් තෝරා නොගතයුතු වුවත් ඊට අනුකූල නොවී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක ග්‍රාම නිලධාරී වසම් 14 ක එවැනි කර්මාන්ත සඳහා ප්‍රතිලාභීන් 14 දෙනෙකු තෝරාගෙන තිබුණි.

(v) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.5.1 (අ) අනුව ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින් විසින් සළකා බලනු ලබන ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා අරමුදල් ලැබෙන බවට සාමූහිකවත්, තනි තනිවත් වගකිවයුතු වුවත්, ප්‍රතිපාදන නොමැතිවීම හේතුවෙන් මාතර හා අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකෙහි 2021 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 4,643,834 ක් වූ නොගෙවූ බිල්පත් 40 ක් විෂයභාර නිලධාරී භාරයේ තිබුණි. ඒ අතුරින් බිල්පත් 21 කට අදාළ රු.1,969,169 ක් වටිනා භාණ්ඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලැබී තෝරාගත් ප්‍රතිලාභීන් වෙත බෙදා දීම සිදුකර තිබුණි. ඉතිරි බිල්පත් 19 සඳහා ඇණවුම් කරන ලද භාණ්ඩ විගණිත දිනය වූ 2022 මාර්තු 23 දින වන විටද ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලැබී නොතිබුණි.

4. තිරසාර සංවර්ධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 ප්‍රකාරව ළඟාකර ගතයුතු අරමුණු සහ ඉලක්ක කරා ලඟාවීමේ සූදානම පිළිබඳ පරීක්ෂා කිරීමේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 සම්බන්ධයෙන් 2021 වර්ෂය තුළදී ද නිසි අවධානය යොමුකර නොතිබුණි. වර්ෂය තුළ ලද ප්‍රතිපාදන මත පදනම්ව තිරසාර සංවර්ධන අරමුණු 6 ක් හඳුනාගෙන තිබුණු අතර තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 ට අනුව අරමුණු 11 ක් කෙරෙහි කිසිදු අවධානයක් යොමුකර නොතිබුණි.

(ආ) හඳුනාගත් අරමුණු 06 සම්බන්ධයෙන් වන ඉලක්ක, පාදක දත්ත, ඉලක්ක ළඟාවිය යුතු සන්ධිස්ථානයන් මෙන්ම ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි.

(ඇ) 2018 අප්‍රේල් 27 දිනැති අංක MSDW/08/65 දරන තිරසාර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව තිරසර සංවර්ධන අරමුණු ජාතික මට්ටමේ උපායමාර්ගික කළමනාකරණ සැලැස්මකට අනුව ආයතනිකව, පළාත් හා ජාතික මට්ටමේ ළඟාකර ගැනීම සඳහා සම්බන්ධීකරණය කිරීමට ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දෙදෙනෙකු නම් කර තිරසාර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය වෙත යොමු කර නොතිබුණි.

5. යහපාලනය

රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ 2018 ජනවාරි 24 දිනැති අංක 05/2018(1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන චක්‍රලේඛයෙන් හඳුන්වාදී ඇති පරිදි පූරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කර ක්‍රියාත්මක කළයුතු වුවද මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඒ අනුව කටයුතු කර නොතිබුණි.

6. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2021 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 1733 ක් ද, තථ්‍ය සේවක සංඛ්‍යාව 1827 ක් ද වූ අතර කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු 10 ක් පියවා ගැනීමට හා 104 දෙනෙකුගෙන් යුත් අතිරික්ත කාර්ය මණ්ඩලය විධිමත් පරිදි අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) රාජ්‍ය පරිපාලන ලේකම්ගේ අංක 02/2018 හා 2018 ජනවාරි 24 දිනැති චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. තවද සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම ඉහත චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි.

(ඇ) 2017 සැප්තැම්බර් 20 දිනැති අංක 4/2017 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව ආයතනයේ නිලධාරීන් බඳවා ගැනීම්, ඉල්ලා අස්වීම්, සේවය අතහැර යාම්, සේවයෙන් පහකිරීම්, විශ්‍රාම ගැන්වීම් හා මියයාම් වැනි කරුණු හේතුවෙන් සිදුවන කාර්ය මණ්ඩල වෙනස්වීම් යාවත්කාලීන කර සෑම කාර්තුවක් අවසාන වී මාසයක් ඇතුළත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර නොතිබුණි.

කේ.එච්.යූ.ඩී. සරත් කුමාර
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

කේ.එච්.යූ.ඩී. සරත් කුමාර
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

පිටපත: 1. අධ්‍යක්ෂ ජනරාල් , රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව - කාරුණික දැනගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා.

2. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කාරුණික දැනගැනීම සඳහා.

NATIONAL AUDIT OFFICE OF SRI LANKA